# අපේ පරිහාණියේ මුල

අද අප රටේ විනය පිරිහී ඇති බව දසතින්ම කියැවෙයි. නීතිය රකින්නකු ඇත්නම් ඒ කලාතුරකිනි. නීතිය ක්‍රියාත්මක කෙරෙන්නේ ඊටත් කලාතුරකිනි. එබැවින් හැකි සෑම එකාම නීතිය අතට ගෙන ක්‍රියා කරයි. විශ්වවිද්‍යාල සිසුන් පමණක් නොව පාසල් සිසුහුද ඇණ කොටා ගනිති. බලයෙන් ඔළුව උදුම්මාගත්තවුන් ඇත්තේ වායු සමනය කරන ලද කාමරවල පමණක් නොවේ. කාර්යාල කාර්ය සහායකයෝද, නවක වදය නමින් කෙරෙන මිලේච්ඡ ක්‍රියාවල නිරත වන්නෝද පෞද්ගලික බස් රථවල කොන්දොස්තරවරුද, ජනමාධ්‍යවේදීහුද, බටහිර වෛද්‍යවරු ද ආදී කී නොකී පිරිස් තමන්ට ඇතැයි සිතෙන බලතල පාවිච්චි කරති. අනෙක් පුද්ගලයන් ගැන නොසිතන මිනිසුන් මේ රටේ තරම් වෙනත් රටක නැති තරම්ය. මේ තත්ත්වයට වැඩි හිටි අපි සියල්ලෝම වගකිව යුතු වෙමු. රාජකාරි දුරකථන, යාන වාහන ආදිය ගෙවීමක් නොකර පෞද්ගලික කටයුතු සඳහා යොදා නොගන්නා කී දෙනෙක් අප අතර වෙත්ද? දූෂණ ඉහ වහා ගොස් ඇති රටක මේ මොන තරම් සුළු වැරදි දැයි කිසිවකු ඇසීමට ඉඩ ඇත. එහෙත් අපට වරද අනෙක් අය මත පටවා නිදහස් විය නොහැකිය.

අපට මෙසේ සිදු වූයේ කෙසේද? සෑම වරදක්ම සිංහල බෞද්ධයන් මත පැටවීමට බලාපොරොත්තුවෙන් සිටින රාජ්‍ය නොවන සංවිධානවල ඊනියා උගත්තු මෙයට හේතුව ලෙස ඊනියා යුද්ධය, ඊනියා කළු ජූලිය ආදිය දකිති. තවත් සමහරෙක් විවෘත ආර්ථිකයට දොස් පවරති. එහෙත් ගම්වල මිනිසුන් කොස් ගෙඩියට මිනී මරා ගත්තේද අද ඊයේ නොවේ. රට දේශපාලනීකරණයට භාජනය වී දශක ගණනාවක් වෙයි. පොලිසියට, රාජ්‍ය සේවකයන්ට නිදහසේ කටයුතු කර ගැනීමට නොහැකි වී බොහෝ කලකි. ඊනියා පොලිස් කොමිසම් වලින් පොලිසිය අදේශපාලනීකරණය කළ හැකි නොවේ. මේ කොමිසම යනු අතීසාරයට අමුඩ ගැසීමක් පමණකි.

බ්‍රිතානීන් මෙරටට පැමිණ තරමක කාලයක් ගෙවී යෑමෙන් පසුවද මෙරට වැසියන් විනයක් ඇතිව ක්‍රියා කර ඇති බවට සුදු ආණ්ඩුකාරයන්ගේ වාර්තා සාක්ෂි වෙයි. පොසොන් පොහෝ දිනක අනුරාධපුරයට එක් රොක්වන අති විශාල ජනකායන් විසින් පූජා කෙරෙන පඬුරු සහිත පිං පෙට්ටි ඒ ජනකායගෙන් ආරක්ෂා කිරීමට එකල කිසිවකු යෙදීමට අවශ්‍ය නොවීය. එමෙන්ම ඒ ජනකාය තම ගම්රටවල් බලා පිටත්වීමට පෙර තමන් ලැගුම් ගත් භූමිය පවිත්‍ර කර යෑමට ද අමතක නොකළහ. මේ සියල්ල ඒ ජනතාව කෙළේ නීතියකට ගරු කරමින්ද? එදා සමාජය හා අද සමාජය අතර ඇති වෙනස කුමක්ද? එදා සමාජය සර්වතෝභද්‍ර සමාජයක් යැයි මම නොකියමි. එහෙත් ඒ සමාජයෙහි යම් විනයක් විය. විනය නැත්තවුන් අතරින් පතර නොසිටියා නොවේ. ඒ අද විනය ඇත්තවුන් සිටින්නාක් මෙනි. විනය හා නීතිය යනු එකක් නොව දෙකකි. නීතිය යනු පණවන දෙයකි. විනය සමාජයක සංස්කෘතිය විසින් සැකසෙයි. විනය හා නීතිය අතර සම්බන්ධයක් නැතුවා නොවේ. සාමාන්‍යයෙන් නම් එකක් අනෙක විසින් පෝෂණය කරනු ලැබිය යුතුය. එහෙත් අද අපට විනයක් හෝ නීතියක් හෝ නැත.

මේ තත්ත්වය එක් රැයකින් ඇති වූවක් නොවේ. අවුරුදු සියයකට වැඩි කාලයක් තිස්සේ ඇතිවූ ක්‍රියා දාමයක එක් අවස්ථාවක අපි පසුවෙමු. මේ රටට මහා විනාශයක් අත්කර දීමට මග පාදමින් එක් පැත්තකින් එතෙක් ඉංගිරිසි කතාකරන්නන් අතරට සීමා වූ අනුකාරක උසස් අධ්‍යාපනය සිංහල කතාකරන්නන් අතරටද ගෙන ගිය හා අනෙක් පැත්තෙන් මෙරට සාරධර්මවලට පහර දුන් අනුකාරක සාහිත්‍යය සිංහාසනාරූඪ කළ හැටේ දශකය ඇරඹි පසුව, අවුරුදු හතළිහක පමණ කාලයක් තුළ ඒ ක්‍රියා දාමය ත්වරණයක් සහිත ව පිම්මේ යයි. (මෙයින් කියැවෙන්නේ උසස් අධ්‍යාපනය සිංහලෙන් ලබාදීමේ ඇති වරදක් නොව අනුකාරක උසස් අධ්‍යාපනය සිංහලෙන් ලබාදී බොරුම බොරුතකතීරු ප්‍රබුද්ධයන් පිරිසක් සිංහල කතාකරන්නන් අතර බිහි කිරීම වරදය. මේ බොරු කාරයන් ඉංගිරිසි කතාකරන්නන්ට පමණක් සීමා වී සිටි යුගයේ ඔවුන්ට සිංහල සමාජයෙහි කළහැක වූ විනාශය අල්ප විය.) අවාසනාවකට මේ තත්ත්වය තවත් වර්ධනය වනු ඇත. එහෙත් වාසනාවකට ඒ පිළිබඳව බොහෝ දෙනෙක් අවංකවම දුක් වෙති. ඔවුහු ඇතැම් විට විනය හා නීතිය කඩමින් ම දුක්වෙති. ඒ දුක්වීම ගැන අපි සතුටු විය යුතු වෙමු. අපට තවමත් යමක් ඉතිරි වී ඇත. වෙරළු ගෙඩිය අටට පලාගෙන කෑමට දරුවන්ට ඉගැන්වූ සමාජයක් බංකුවක තැන ලබාගැනීම සඳහා මරා ගත යුතුය යන අදහස ඒ දරුවන්ට ම දුන්නේ කෙසේද? ඉතා කෙටියෙන් කරුණක් දෙකක් පමණක් සඳහන් කිරීමට බලාපොරොත්තු වෙමි.

© Prof. Nalin De Silva

යමක් කෙටියෙන් කිව හැක්කේ වියුක්තවය. එහෙත් අපේ සංස්කෘතිය වියුක්තයට එතරම් තැනක් නොදෙයි. කෙටියෙන් කියන්නේ නම් මෙහිදී සිදු වන්නේ අප මත බලයෙන් පටවන ලද නීති, ධුරාවලි. හර පද්ධති ආදිය සහිතව බටහිර නූතනත්වය අවශෝෂණය කර ගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ නොහැකිව අප ප්‍රපාතයෙන් ප්‍රපාතයට ඇද වැටීමය අපට බටහිර නූතනත්වය මුළුමනින්ම ප්‍රතික්ෂේප කළ හැකි නොවේ. එබැවින් අපි එය අවශ්‍ය පරිදි අවශෝෂණය කළ යුතු වෙමු. එහෙත් ඒ කරන්නේ කෙසේ දැයි අපි නොදනිමු. මේ සම්බන්ධයෙන් වරද පැටවෙන්නේ දේශපාලනඥයන්ට නොව මූලිකවම බටහිර අධ්‍යාපනයක් ලැබුවන්ටය. එහෙත් ඔවුහු පමණක්ම වරදකරුවෝ නොවෙති. අපේ සම්ප්‍රදායෙහිම පශ්නයක් වෙයි. මේ අඩු ලුහඬුකම නැති කරගැනීම අපේ වගකීම වෙයි. අඩු ලුහුඬුකම් යනුවෙන් වාස්තවික නිරපේක්ෂ දෙයක් නැත. එක් සංස්කෘතියක අඩුපාඩුවක් ලෙස පෙනෙන්න තවත් සංස්කෘතියක අඩුපාඩුවක් ලෙස නොගැනෙයි. අපේ අඩුපාඩුකම් අප දැකිය යුත්තේ අපට සාපේක්ෂව මිස බටහිරට සාපේක්ෂව නොවේ හැටේ දශකයේත් ඉන් පසුවත් සිංහල කතා කරන ඊනියා ප්‍රබුද්ධයන් අතර සිදු වූ හා සිදුවන බරපතළම වරද නම් අඩුපාඩුකම් වලට නිරපේක්ෂ වාස්තවිකත්වයක් ලබාදී බටහිරට සාපේක්ෂව දකින අඩුපාඩුකම් ඊනියා නිරපේක්ෂක අඩුපාඩුකම් ලෙස සැලකීමය.

අපි භාරතයෙන් වෙනස් වෙමු. ඒ ඊනියා මහා සම්ප්‍රදාය හා චුල සම්ප්‍රදාය භේදයක් නිසා නොවේ. මේ චුල - මහා සම්ප්‍රදාය ගැන කතා කරන බොහෝ දෙනාට ඒ ගැන අවබෝධයක් නැතිබව ඔවුන් ලියන කියන දෙයින් පෙනෙයි. ඔවුන් රෙඩ්ෆීල්ඩ් නම විද්වතා ගැන අසාවත් නැත. මේ විද්වතා චුල - මහා සම්ප්‍රදාය පිළිබඳ ප්‍රවාදය නිර්මාණය කර ඇත්තේ බටහිර නූතනත්වය හා සංස්කෘතික යටත් විජිතවාදය යුක්ති යුක්ත කිරීම සඳහාය. මේ කසිකබල් ප්‍රවාදය ප්‍රතික්ෂේප කරමින් මා ලියූ ලිපියක් ජාතිය, සංස්කෘතිය හා චින්තනය පොතෙහි පළවී ඇත. භාරත හා අප අතර වූ වෙනස කුමක්ද? අප අතීතයෙහි නිර්මාණාත්මකව දක්ෂකම පෙන්වා ඇත්තේ ශිල්ප සම්බන්ධයෙන් මිස ශාස්ත්‍ර සම්බන්ධයෙන් නොවේ. අපි ශිල්පීය ව ගත්කල ඉතාමත් නිර්මාණශීලී පිරිසක් වීමු. වැව් දාගැබ් ඇතුළු ඉදිකිරීම් අංශයෙහි පමණක් නොව වෙදකම සංගීතය ආදිය සම්බන්ධයෙන් ගත්කල අපට ඇත්තේ ශිල්පීය නිර්මාණශීලී බවක් මිස ශාස්ත්‍රීය නිර්මාණශීලී බවක් නොවේ. අප විසින් නිර්මාණය කෙරී ඇති ප්‍රවාද හා සංකල්ප ඉතා අල්පය. බෞද්ධ දර්ශනයෙහි පවා අපේ නිර්මාණ එතරම් නැත. අපේ යැයි කියැවෙන නිර්මාණ බොහෝ විට භාරතයෙන් වැඩම කළ බ්‍රාහ්මණ වංශයෙහි උපත ලැබ පැවිදි වූ භික්ෂූන් වහන්සේ අතින් කෙරී ඇත. භාරතයෙහි ප්‍රවාද නිර්මාණය කළෝ බොහෝ විට බ්‍රාහ්මණයෝ වූහ. බෞද්ධ දර්ශනය සම්බන්ධයෙන් වුවද, නව දැනුම, ප්‍රවාද හා සංකල්ප නිර්මාණය කළෝ බ්‍රාහ්මණ වංශයෙහි උපත ලැබූ භික්ෂූන් වහන්සේලාය. මිලින්ද ප්‍රශ්නයෙහි නාගසේන හිමි, බුද්ධඝෝෂ හිමි, බුද්ධදත්ත හිමි, නාගරජුන හිමි, අසංග වාසුබන්ධු හිමිවරු ආදී මහායාන මෙන්ම ථෙරවාද හිමිවරු ද බ්‍රාහ්මණ වංශයෙහි උපත ලැබූහ. බටහිර දැනුම සම්බන්ධයෙන් යුදෙව ගෝත්‍රිකයන් හා යුදෙව් චින්තනය විසින් කෙරෙන කාර්යය එදා භාරතීය දැනුම සම්බන්ධයෙන් බ්‍රාහ්මණයන් හා වෛදික චින්තනය විසින් කෙරිණි. අප ප්‍රවාද නිර්මාණය නොකෙළේ වත්මන් ඊනියා උගතුනට තඩි බෑම සඳහා ගෙදර ඇති මුව හමක් වූ ථෙරවාද බුද්ධාගමක් නිසා නොව අපට බ්‍රාහ්මණ වැනි සම්ප්‍රදායක් නොතිබුණු බැවිනි. බටහිර දැනුම ලබාගත් මේ කසිකබල් උගතුන්ට ථෙරවාදය පැත්තකට දමා අඩු තරමින් බටහිරින් යමක් ඉගෙන ප්‍රවාද නිර්මාණය කිරීමට නොහැක්කේ ඇයි?

ආසියාවේ මිනිසුන් තුවක්කු ගැන දැන ගත්තේ බටහිරයන්ගෙනි. බටහිරයන්ගේ දැනුම ලබාගත් පසු ලෝකයේ හොඳම තුවක්කු තැනුවෝ ජපන්නු හා සිංහලයෝය. සිංහලයෙන් මෙන්ම ජපනුන්ද වැඩි වශයෙන් දස්කම් දක්වන්නේ ශිල්පීය අංශයෙනි. එහෙත් ජපනුන් හා සිංහලයන් අතර වෙනසක් වෙයි. සිංහලයෝ තමන් දක්ෂතාවයක් ශිල්පය නොසලකා තමන්ට බැරි ශාස්ත්‍රයට මහා වැදගත් තැනක් දුන්හ. මෙහිදී ශාස්ත්‍රය බැරිය යන්නෙන් මා අදහස් කරන්නේ ශාස්ත්‍ර ඉගෙනීමට ඇති බැරි කමක් නොවේ. අපට එහි දක්ෂතාවයක් ඇති බව ඉහළින් විභාග සමත්වන අයගෙන් පෙනී යයි. ලෝකයේ බොහෝ රටවල අපේ ශිෂ්‍යයෝ විභාගවලින් ඉහළ දස්කම් දක්වති. එහෙත් ඉන්පසු අපට ඔවුන් ගැන එතරම් දෙයක් අසන්නට නොලැබෙයි. අපට නොහැක්කේ ශාස්ත්‍රයෙහි නිර්මාණ කිරීමය. (ශාස්ත්‍ර යන්නට විද්‍යාව ද ඇතුළත් වෙයි.)

ඉංගිරිසින්ගේ අනුදැනුමෙන් අපේ ශිල්පීය කුල පහතට දැමූ අපි විභාග සමත්වන්නන්ට වැදගත් තැනක් දුන්නෙමු. අදත් අප සලකන්නේ ඕ අටට හෝ ඒ තුනට හෝ හතරට මිස අළුත් යමක් (යන්ත්‍රයක් වැන්නක) නිර්මාණය කිරීමට නොවේ. අපේ ශාස්ත්‍රීය සම්ප්‍රදාය පැරණි පොත් ශුද්ධ කිරීම, කරුණු එකතු කිරීම ආදියට සීමා විය. ඒ දේ නොකළ

© Prof. Nalin De Silva

යුතු යැයි මෙයින් නොකියැවෙයි එහෙත් එයට පමණක් සීමා වී, සංකල්ප හා ප්‍රවාද නිර්මාණය නොකිරීම අප කළ වරද වෙයි. අප බොහෝ විට කෙළේ වියුක්ත ප්‍රවාද නිර්මාණය කිරීම නොව සංයුක්ත මත ඉදිරිපත් කිරීමය. කව් සිළුමිණ දෙවැනි පැරකුම්බාවන්ගේ කෘතියක්ද නැත්නම් පළමුවැනි පරාක්‍රමබාහු රජුගේ කෘතියක්ද, සඳකඩ පහණින් නිරූපණය වන්නේ කුමක්ද, සීගිරිය කාශ්‍යප රජුගේ කුවේර මාළිගාව ද නැත්නම් මහායාන මධ්‍යස්ථානයක්ද ආදී, ප්‍රශ්න ගැන අපි සිත යොමු කරමු. ඒ කළ යුතුය. එහෙත් ඉන් ඔබ්බට ගොස් සාධාරණ හෙවත් පොදු ගුණ පිළිබඳව වියුක්ත ප්‍රවාද ගොඩ නැගීමට අපි මහන්සි නොගන්නෙමු. එදා ප්‍රවාද සඳහා අපි භාරතය දෙස බැලුවෙමු. අද ඒ සඳහා බටහිරට නෙත් යොමු කරමු. බෞද්ධ දේශපාලනය යනුවෙන් අප කතා කෙළේ සූත්‍ර දේශනාවෙහි දේශපාලනය ගැන සඳහන් වී ඇති කරුණු ගැනය. සූත්‍ර දේශනාව පදනම් කරගෙන නව දේශපාලන ප්‍රවාද ගොඩ නගා ගැනීමට අපි කල්පනා නොකෙළෙමු. මේ සියල්ලෙහි ප්‍රතිඵලය වූයේ අප බටහිර දැනුම අනුකාරික ව ලබාගැනීම මිස අවශෝෂණය කර නොගැනීමය. බටහිර දැනුම අවශෝෂණය කිරීමද ප්‍රවාද නිර්මාණයක් බව අමතක නොකළ යුතුය. මෙහිදී යමකු මෙවැනි ප්‍රශ්නයක් ඇසීමට ඉඩ ඇත. වියුක්ත ප්‍රවාද නිර්මාණය කිරීමද බටහිර අනුකරණයක් නොවන්නේද? මෙය වැදගත් ප්‍රශ්නයකි. වියුක්ත ප්‍රවාද නිර්මාණය බටහිර නූතනත්වය සමග නැවතත් කළ එළි බැස්ස ද එහි ආරම්භය ග්‍රීකයන් වෙතට යයි. බටහිර නූතනත්වය විසින් ග්‍රීකයන් වෙතට යයි. බටහිර නූතනත්වය විසින් ග්‍රීකයන්ගේ ප්‍රවාද නිර්මාණය අවශෝෂණය කෙරිණි. අද අප කළ යුත්තේ බටහිර වියුක්ත ප්‍රවාද නිර්මාණය අපේ සංස්කෘතිය තුළට අවශෝෂණය කරගැනීමය.

**(මතු සම්බන්ධයි)**

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva